# රුවන්වැලි මහා සෑය

රුවන්වැලි මහා සෑය ලංකාවේ වඩාත්ම වැදගත් ස්තූපය ලෙස කීර්තිමත් ස්ථානයක් දරයි. දුටුගැමුණු මහරජතුමා ( ක්‍රි.පූ. 161 - 137 ) විසින් ඉදිකරන ලද දෙවෙනි දාගැබ වන එහි සුවිශේෂී ඉතිහාසය දිවයිනේ ඓතිහාසික වංශකතාවක් වන මහාවංශයේ පුළුල් ලෙස ලේඛනගත කර ඇත. ස්වර්ණමාලී මහා සෑය ලෙසින්ද ප්‍රසිද්ධ මෙම දාගැබ අනුරාධපුරයේ ඉදිකරන ලද ස්ථූප අතරින් විශාලතම හෝ පැරණිතම ස්තූපය නොවූවත්, වැදගත්කම අතින් ඒ සියල්ල අභිබවා යයි. මෙයට මූලික වශයෙන් හේතු වී ඇත්තේ ගෞතම බුදුන් වහන්සේගේ ද්‍රෝණයක් ධාතු එහි තැන්පත් කර තිබීමයි.

රුවන්වැලි දාගැබ තුළ මෙවැනි ගෞරවනීය ධාතූන් වහන්සේලා වැඩ සිටීම නිසා එය බෞද්ධයන් අතර සුවිශේෂී පූජනීයත්වයට හා ගෞරවයට බඳුන් වූ ස්ථානයක් බවට පත් වී ඇත. යුග ගණනාවක් පුරා බුදුදහමේ අධ්‍යාත්මික සාරය සංකේතවත් කරන අද්විතීය වැදගත්කමක් ඇති ස්මාරකයක් ලෙස රුවන්වැලි මහා සෑය අගය කර ඇත. අදටත් මෙම ස්ථූපය බෞද්ධ බැතිමතුන්ගේ ගෞරව භක්තියේ උතුම්ම වන්දනීය වස්තුවක් ලෙස එහි අනභිභවනීයත්වය පවත්වා ගෙන යයි

## රුවන්වැලි මහා සෑය



# රුවන්වැලි මහා සෑය වන්දනා ගාථාව

සයිංසු යස්මිං සුගතස්ස ධාතු

නිම්මාය රංසුජ්ජල බුද්ධ රූපං

සුවණ්ණ මාලිති පතීත නාමං

වන්දාමහං ථූපවරං මහග්ඝං

තථාගත සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ උතුම් ධාතූන්වහන්සේලා

වර්ණ සයකින් යුත් බුදු රැස් විහිදුවන බුදුරුවක් මවා ප්‍රාතිහාර්ය දක්වා

ස්වර්ණමාලී නමින් පටබැඳි ඒ උතුම් චෛත්‍ය රාජයාණන්වහන්සේ තුල සැතපුන සේක්ද

ඒ මහා අනර්ඝ වූ උතුම් චෛත්‍ය රාජයාණන්වහන්සේ මා වන්දනා කරමි








www.srilankaview.com    වෙතින් දහම් තිළිණයකි